අල්ලස දූෂණය නාස්තියට එරෙහි පුරවැසි බලය

Citizen Power Against Bribery Corruption Waste

No. 67, "Nandana", Eluwila, Panadura.
Tel No : 077- 4741470

නො. 67, "නන්දන" එළුවිල පානදුර.
දු . ක : 077- 4741470)

2026.10.29

සභාපති,

අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව,

නො.36, මලලසේකර මාවත,

කොළඹ 07.

ෂැන්ග්‍රි - ලා හා One ගෝල්ෆේස් ගොඩනැගිලි සහිත ඉඩම විකිණීමේ දී සිදු කරන ලද දූෂණ වංචා පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කිරීම

එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරී 454) 23(2) වැනි වගන්තියට අනුව ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග විසින් 2010 දෙසැම්බර් 29 ඔප්පු අංක 4/10/33433යටතේ පිඹුරු අංක 9132 ලොට් 01 කොටසේ හෙක්ටයාර් 2.4361 විශාල ඉඩම ෂැන්ග්‍රි - ලා ගෝල්ෆේස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත ඇමරිකන් ඩොලර් මිලියන75 ක් (ශ්‍රී ලංකා රුපියල් මිලියන 8250) මුදලකට විකිණීම මෙම සමාගම PV 75660 යටතේ 2010/11/19 දින අධ්‍යක්ෂ මොහොමඩ් සජාඩ් මව්ෂූන් වශයෙන් සමාගම් මැදුරේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 9132 ලොට් 02 කොටසේ හෙක්ටයාර් 1.6108 කොටස 2011 මාර්තු 15 දින ඉහත ආකාරයටම ඉහත සමාගමට රුපියල් මිලියන 5499ට විකුණන ලදී. මෙම සම්පූර්ණ ඉඩම අක්කර 10 යි පර්චස් 11 ප්‍රමාණය රුපියල් මිලියන 13749ක විකිණීමක් සිදු කර ඇත.

පහත කාරණා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙම විකිණීම දූෂිත ගණු දෙනුවක් බව පෙනී යයි.

1.ඉඩම් ආඥා පනතේ (අධිකාරී 454) 23 (2) වගන්තියට අනුව පුද්ගලික ආයෝජකයෙකුට ඉඩම් විකිණීමේ දී සිදු කල යුතු ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කිරීම

2. මෙම ගණු දෙනුව දින 3ක කාලයක දී සියලු කටයුතු සිදු කිරීම

   1 .පිඹුර ඇඳීම 2010/12/27 සිදු කිරීම

   11 .ඔප්පු ලිවීම 2010/12/28 සිදු කිරීම

   111.ඔප්පුව ලියා පදිංචි කිරීම 2010/12/29 සිදු කිරීම

3. කැබිනට් අනුමැතියක් සොයා ගැනීමට නොහැකි වීම

4. තක්සේරු වාර්තා පිළිබඳ කරුණ

5. ප්‍රසිද්ධ වෙන්දේසිය හෝ ඉල්ලුම් පත් කැඳවීමක් සිදු නොකිරීම

ඉහත කාරණා අධ්‍යනය කිරීමේ දී රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරිය 454) 23 (2) යටතේ ජනාධිපති වරයාට තිබෙන බලතල අවභාවිතා කොට ජනාධිපති වරයාට හිතැති පිරිසකට මෙම ඉඩම විකුණා ඇති බව පෙනී යයි. දූෂණ විරෝධී පනතට අනුව මෙය ඉතා දූෂිත ගණු දෙනුවක් බව පෙනී යයි. එම නිසා මෙම ඉඩම නැවත රජයට පවරා ගෙන දූෂිත ගණු දෙනු වලට සම්බන්ධ පුද්ගලයන් හට නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටී.

....

ජාමුණී කමන්ත තුෂාර,

සභාපති,

අල්ලස දූෂණය නාස්තියට එරෙහි පුරවැසි බලය